# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2081/44 - 2018 ජූලි මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2018.07.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 24/51(iv)

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 128 අ වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

නිමල් සිරිපාල ද සිල්වා,
ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය.

2018 ජූලි මස 24 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග මෝටර් වාහන (පොදු සේවා මෝටර් ට්‍රයිසිකල්) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ය.

2. මේ නියෝග ක්‍රියාත්මක වීමෙන් පසුව, මෝටර් ට්‍රයිසිකල් සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් ලබාගන්නා සහ එම මෝටර් ට්‍රයිසිකලය යම් ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් සඳහා මගීන් රැගෙන යාම සඳහා භාවිත කරන හෝ භාවිත කිරීම සඳහා අනුවර්තනය කරන හෝ තබාගෙන සිටින සෑම තැනැත්තකු (මෙහි මින්මතු ''මෙම නියෝග අදාළ විය යුතු තැනැත්තකු'' යනුවෙන් සඳහන් කරනු ලබන) සඳහා මෙම නියෝග අදාළ විය යුතු ය.

3. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා (මෙහි මින්මතු ''කොමසාරිස් ජනරාල්වරයා'' යනුවෙන් සඳහන් කරනු ලබන) විසින් එම කාර්ය උදෙසා රියදුරු බලපත්‍රය මත පිටසන් කරන ලද විශේෂ පිටසන යටතේ හැර මෙම නියෝග අදාළ වන්නා වූ කිසිදු තැනැත්තකු විසින් පොදු සේවා මෝටර් ට්‍රයිසිකලයක් පැදවීම නොකළ යුතු ය.

4. 3 වන නියෝගය යටතේ පිටසනක් සඳහා ඉල්ලුම් කිරීමට අදහස් කරන සෑම තැනැත්තකුම :-

(අ) අවුරුදු තිස්පහට නොඅඩු සහ අවුරුදු හැත්තෑවට නොවැඩි විය යුතු ය ; සහ

(ආ) මෝටර් ට්‍රයිසිකල් ධාවනය සඳහා රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව අවම වශයෙන් වසර දෙකක කාල සීමාවක රිය පැදවීමේ පළපුරුද්දක් තිබිය යුතු ය.

5. 3 වන නියෝගය යටතේ පිටසනක් සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක්ම මෙහි සඳහන් උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූලව සකසාගත් ඉල්ලුම්පත්‍රයක් මගින් -

(අ) ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය දෙන ලද වෙනත් යම් ආයතනයක් විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් ;

(ආ) කොමසාරිස් ජනරාල්වරයා විසින් සැලසුම් කළ, අනුමත කළ සහ මෙහෙය වන පුහුණු කිරීමේ පාඨමාලාවක් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය දෙන ලද ආයතනයක් විසින් මෙහෙය වන එකී පුහුණු කිරීමේ පාඨමාලාව සඳහා සහතිකයක් ; සහ

(ඈ) දිවයිනේ ලියාපදිංචි අපරාධකරුවකු ලෙස අයදුම්කරු ලියාපදිංචි වී නොමැති බවට තහවුරු කෙරෙන පොලිස් වාර්තාවක් ; සහ

(ඈ) රුපියල් දෙදහසක ගාස්තුවක් සමග ;

කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

6. මෙම නියෝග අදාළ විය යුතු තැනැත්තකු, දිවයිනේ ලියාපදිංචි අපරාධකරුවකු ලෙස (22 වන අධිකාරය වූ) අපරාධ වැළැක්වීමේ ආඥාපනත යටතේ ලියාපදිංචි කර ඇතිනම් ඒ තැනැත්තා පොදු සේවා මෝටර් ට්‍රයිසිකල් රියදුරකු ලෙස කටයුතු කිරීමට නුසුදුසු විය යුතු ය.

7. මෙම නියෝගවල

''මෝටර් ට්‍රයිසිකලය'' යන්නට (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ නිශ්චිතව සඳහන් කර ඇති අර්ථය ම තිබිය යුතු ය ; සහ

''පොදු සේවා මෝටර් ට්‍රයිසිකලය'' යන්නෙන් ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් සඳහා මගීන් රැගෙන යාම සඳහා භාවිතා කරන හෝ අනුවර්තිත හෝ තබා ඇති යම් මෝටර් ට්‍රයිසිකලයක් අදහස් වේ.

## උපලේඛනය

*(5 වන නියෝගය)*

පොදු සේවා මෝටර් ට්‍රයිසිකල් පැදවීමට විශේෂ පිටසනක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය

1. මුලකුරු සමග නම : ..............................
2. සම්පූර්ණ නම : ..............................
3. ලිපිනය : ..............................
4. දිස්ත්‍රික්කය : ..............................
5. ජාතික හැඳුනුම්පත් අංකය : ..............................
6. උපන් දිනය : ..............................
7. ස්ත්‍රී/පුරුෂ භාවය : ..............................
8. රැකියාව : ..............................
9. බලපත්‍රය වලංගුවන්නා වූ
   වාහන පන්තිය හෝ වාහන පන්ති : ..............................
10. රියදුරු බලපත්‍රයේ තොරතුරු
    (අ) රියදුරු බලපත්‍ර අංකය : ..............................
    (ආ) නිකුත් කළ දිනය : ..............................
    (ඇ) ඉකුත් වන දිනය : ..............................
    (ඈ) රියදුරු අකුසලතා ලකුණු (ඇත්නම් පමණක්) : ..............................

අත්සන :

දිනය :

08 - 423

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.